## ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - බදුල්ල

# ඌව පළාත් සමාජ විද්‍යා තරගාවලිය - 2022

**10 ශ්‍රේණිය** කාලය: පැය 02යි

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම : ..............................................................................

පාසලේ නම : ..............................................................................

පාසල් වර්ගය : ..................................

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

- ප්‍රශ්න අංක 01-05 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. මෙරට ඉතිහාසය හැදෑරීමේ දී වඩාත් විශ්වාසනීයම සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද?
   1. ථූප වංශය 2. දීප වංශය 3. මහා වංශය 4. බෝධි වංශය

02. උඩරට රාජධානි සමයේ මෙරට තොරතුරු ඇතුළත් කොට "එදා හෙළදිව" නම් කෘතිය රචනා කළ ඉංග්‍රීසි ජාතික කතුවරයා කවුද?
   1. රිබෙයිරෝ 2. රොබට් නොක්ස් 3. ජෝන් ඩොයිලි 4. රොබට් බ්‍රවුන්රිග්

03. මහා වංශය රචනා කළ මහානාම හිමියන් වැඩ සිටි පිරිවෙන වන්නේ,
   1. දික් සඳ සෙනෙවියා පිරිවෙනය. 2. මරුගන පිරිවෙනය.
   3. සුනහාත පිරිවෙනය. 4. එලග්ග පිරිවෙනය.

04. අර්ධ ශුෂ්ක කලාපයට අයත් ප්‍රාග් ඓතිහාසික ස්ථානයක් නම්,
   1. අලිගල ය 2. පාහියන්ගල ය 3. මිනිහාගලකන්ද ය 4. පිදුරන්ගල ය

05. පහත දැක්වෙන පිළිතුරු අතරින් ගම්කට අයත් නොවූ කාර්යය කුමක් ද?
   1. ගම තුළ ඇතිවන ආරවුල් විසඳීම. 2. ගමට අයත් වැව නඩත්තු කිරීම.
   3. වැවේ ජලය බෙදා හැරීම. 4. වැව් පද්ධතිය නඩත්තු කිරීම.

(ලකුණු 1 x 5 = 5)

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු අතරින් වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06. වේගයෙන් හමන සුළංධාරා උපයෝගී කර ගනිමින් යපස් උණු කිරීමේ තාක්ෂණයක් ලංකාවේ පැවැති බවට සාධක ලැබී ඇත්තේ කවර ප්‍රදේශයෙන් ද?
   1. ඉබ්බන් කටුව ප්‍රදේශයෙනි. 2. බලංගොඩ සමනල වැව ප්‍රදේශයෙනි.
   3. ඉරණමඩුව ප්‍රදේශයෙනි. 4. වෙරළාශ්‍රිත ප්‍රදේශයෙනි.

07. ලෝකයේ විශාලතම කඳු පද්ධතිය වන හිමාලය පිහිටා ඇත්තේ කුමන මහාද්වීපයේ ද?
   1. ආසියා මහාද්වීපයේ ය. 2. යුරෝපා මහාද්වීපයේ ය.
   3. අප්‍රිකා මහාද්වීපයේ ය. 4. ඇමෙරිකා මහාද්වීපයේ ය.

08. ඉන්දු, බ්‍රහ්ම පුත්‍ර, ඉරවදි ගංගා ගලා බසින්නේ කුමන සාගරයට ද?

1. ආක්ටික් සාගරයට ය.
2. පැසිෆික් සාගරයට ය.
3. අත්ලාන්තික් සාගරයට ය.
4. ඉන්දියන් සාගරයට ය.

09. පවුලෙන් ලැබුණු සමාජ සුරක්ෂිතභාවය නිසා ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවෙකු බවට පත් වූ පුද්ගලයෙකු වන්නේ,

1. ජෝර්ජ් වොෂිංටන්
2. තෝමස් අල්වා එඩිසන්
3. ඒබ්‍රහම් ලින්කන්
4. මහත්මා ගාන්ධි

10. 1948 දෙවන නිදහස් අරගලයට ආසන්නතම හේතුව වූයේ,

1. දේශීය කෘෂි කර්මය සඳහා රාජ්‍ය අනුග්‍රහය නොලැබීම.
2. ගම් සභාව සතු බලතල ඉවත් කිරීම.
3. ටොරිංටන් ආණ්ඩුකාරවරයාගේ නව බදු ප්‍රතිපත්ති
4. රට පුරා පුරාසැල් ආරම්භ කිරීම.

(ලකුණු 1 x 5 = 5)

• ප්‍රශ්න අංක 11– 15 දක්වා ප්‍රශ්න සඳහා හිස්තැනට ගැලපෙන පිළිතුර තිත් ඉරමත ලියන්න.

11. මැටියෙන් සාදන ලද හිරු ප්‍රසාන දක්නට ලැබෙන්නේ .............................. ඓතිහාසික යුගයේ ය.

12. වඩුවන් විසූ ගම අතීතයේ හැඳින්වූයේ ............................................ ගාම ලෙසයි.

13. සාමූහිකව, සහයෝගයෙන්, සමානාත්මතාවයෙන් යුතුව පොදු අධ්‍යාපන අරමුණු ඉටුකර ගැනීමට හා සමාජ ශුභ සාධනය ඇති කර ගැනීම සඳහා ඇති කර ගත සංවිධානය ........................................ ලෙස හඳුන්වයි.

14. ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටමේ සිට මීටර් 30 දක්වා අයත් වන්නේ ........................................ තැන්නට ය.

15. උස් බිමක පිහිටි සමතලා භූමි ........................................ ලෙස හඳුන්වයි.

(ලකුණු 2 x 5 = 10)

• ප්‍රශ්න අංක 16 - 20 දක්වා ඇති ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

16. ගමක ප්‍රධානියා හෙවත් ගමික විසින් ඉටු කළ කාර්යයන් අතරින් එක් කාර්යයක් සඳහන් කරන්න. ..........................................................................................

17. ඓතිහාසික මූලාශ්‍ර වලට අනුව මෙරට පාලනය කළ පළමු රජතුමා නම් කරන්න. ..............................

18. ක්‍රි.ව.1880 දශකයේ බෞද්ධ පාසල් ආරම්භ කිරීම සඳහා පුරෝගාමීව කටයුතු කළ ඇමෙරිකානු ජාතිකයා කවුද? ........................................................................

19. ක්‍රි.ව.1833 වර්ෂයේ ඉදිරිපත් කළ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වලට අනුව ලංකාව පළාත් කීයකට බෙදන ලද්දේ ද? ........................................................................

20. භූමියේ උස අනුව උෂ්ණත්වය අඩුවීම හඳුන්වන්නේ කෙසේ ද?

........................................................................ (ලකුණු 2 x 5 = 10)

- ප්‍රශ්න අංක **21 - 25** දක්වා ප්‍රශ්න සඳහා පින්තූර ඇසුරෙන් පිළිතුරු සපයන්න.

21. I. A රූපයේ දැක්වෙන පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.

    ..............................................................

    II. මොහු විසින් රචිත කෘතියේ නම සඳහන් කරන්න.

    ..............................................................

A


22. I. යාබද B රූපයේ දැක්වෙන සෙල් ලිපිය නම් කරන්න.

    ..............................................................

    II. මෙය රචනා කරවන ලද්දේ කිනම් රජතුමා විසින් ද?

    ..............................................................

B


23. I. C රූපයේ කැටයම දක්නට ලැබෙන ඓතිහාසික විහාරස්ථානය නම් කරන්න. ..............................................................

    II. මෙහි මානව රූපයෙන් නිරූපණය වෙනවා යැයි විශ්වාස කරන දෙවියන් කවුද? ..............................................................

C


24. I. යාබද D පින්තූරයේ දැක්වෙන වනාන්තරය කවර වෘක්ෂලතා කලාපයට අයත් වන්නේ ද?

    ..............................................................

    II. මෙහි වෘක්ෂලතාවන්හි දක්නට ලැබෙන එක් ලක්ෂණයක් ලියන්න. ..............................................................

D


25. I. E පින්තූරයේ දැක්වෙන අගමැතිවරයා නම් කරන්න.

    ..............................................................

    II. මෙතුමා අග්‍රාමාත්‍යධුරය හෙබවූයේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ද?

    ..............................................................

E


(ලකුණු 2 x 5 = 10)

- **ප්‍රශ්න අංක 26 - 30 දක්වා ප්‍රශ්න වලට 'අ' තීරුව හා 'ආ' යනුවෙන් තීරු දෙකකි.ඒවායේ සම්බන්ධතාවය අනුව ගැළපූ විට ඇති නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

26.

| "අ" | "ආ" |
|---|---|
| 1. ඉබන් බතූතාගේ දේශාටන වාර්තා | A. ඕලන්ද මූලාශ්‍ර |
| 2. මැල්ඩියස් ගේ ලංකා පුරාවෘත්ත | B. ග්‍රීක මූලාශ්‍ර |
| 3. ඩිමුන්ඩෝ කෘතිය | C. අරාබි මූලාශ්‍ර |
| 4. නැචුරාලිස් හිස්ටෝරිය | D. රෝම මූලාශ්‍ර |

1. C B A D  2. A B C D  3. A D C B  4. C A B D

27. “අ” / “ආ”

1. පරම විඥානාර්ථ සමාගම
2. රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන
3. මහාබෝධි සමාගම
4. මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන

A. අනගාරික ධර්මපාල තුමා
B. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා
C. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
D. වලපනේ සිද්ධාර්ථ හිමි

1. B D A C  2. B A D C  3. C B D A  4. C D B A

28. “අ” / “ආ”

1. බිසෝ කොටුව
2. වැව් බැම්ම
3. පිටවාන
4. රළපනාව

A. ජලය රඳවා ගැනීම.
B. වැව් බැම්ම සේදී යාම වැලැක්වීම.
C. වැඩි ජලය ඉවතට යාම.
D. මනා පාලනයෙන් යුතුව වැවේ ජලය ඉවතට ගැනීම.

1. A B C D  2. D A C B  3. D C A B  4. C A D B

29. “අ” / “ආ”

1. නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති
2. නිදහස් අධ්‍යාපනයේ පියා
3. ශ්‍රී ලංකාවේ ප්‍රථම නාමික ජනාධිපති
4. ප්‍රථම විධායක ජනාධිපති

A. ජේ.ආර්.ජයවර්ධන
B. ඩී.එස්.සේනානායක
C. විලියම් ගොපල්ලව
D. සී.ඩබ්.ඩබ්.කන්නන්ගර

1. D B C A  2. B D C A  3. B A D C  4. D B A C

30. “අ” / “ආ”

1. පහත රට තෘණ කලාපීය වනාන්තර
2. අතරමැදි සදාහරිත වනාන්තර
3. කඳුකර තෘණ කලාපීය වනාන්තර
4. කඩොලාන

A. බදුල්ල
B. මුතුරාජවෙල
C. සිංහරාජය
D. සමනල කන්ද

1. A C D B  2. D C A B  3. C A D B  4. A D B C

(ලකුණු 2 x 5 = 10)

- ප්‍රශ්න අංක **31 - 35** දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

31. I. ලංකාවේ පැරණිතම වංශ කතාව ලෙස සැලකෙන සාහිත්‍ය ග්‍රන්ථය නම් කරන්න.

..................................................................................... (ලකුණු 01)

II. මහා වංශය අර්ථ විවරණය සඳහා සම්පාදනය කළ ග්‍රන්ථය නම් කර, එය හඳුන්වන නම සඳහන් කරන්න.

..................................................................................... (ලකුණු 02)

III. ඉතිහාසය ගොඩ නැගීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න.

1. .....................................................................................
2. .....................................................................................
3. .....................................................................................

(ලකුණු 03)

32. I. ඉතිහාස තොරතුරු වලට අනුව මෙරටින් හමු වූ පැරණිතම කාසි හඳුන්වන නම කුමක් ද?

.................................................................... (ලකුණු 01)

II. එම කාසි හඳුන්වන වෙනත් නම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

.................................................... ....................................................

III. කාසි ඉතා වැදගත් මූලාශ්‍රයක් ලෙස සැලකීමට හේතු වූ කරුණු තුනක් නම් කරන්න.

1. ....................................................................................
2. ....................................................................................
3. ....................................................................................

(ලකුණු 03)

33. I. පාලන මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරය තෝරාගත් පළමු රජතුමා කවුද?

.................................................................... (ලකුණු 01)

II. මෙතුමාගෙන් සිදු වූ සේවාවන් දෙකක් ලියන්න.

1. ....................................................................................
2. .................................................................................... (ලකුණු 02)

III. දේවානම් පියතිස්ස රාජ්‍ය සමය වන විට දේශපාලන බලය විමධ්‍ය ගත කිරීම කෙරෙහි බලපාන ලද සාධක තුනක් නම් කරන්න.

1. ....................................................................................
2. .................................................................................... (ලකුණු 03)
3. ....................................................................................

34. I. භූ විෂමතාව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

.................................................................... (ලකුණු 01)

II. භූ විෂමතාව පදනම් කර ගෙන බෙදා ඇති ප්‍රධාන කලාප දෙකක් නම් කරන්න.

1. .................................... 2. .................................... (ලකුණු 02)

III. වෙරළබඩ තැනිතලාවේ දැකිය හැකි ලක්ෂණ තුනක් නම් කර කෙටියෙන් පහදන්න.

....................................................................................
....................................................................................
....................................................................................

(ලකුණු 03)

35. I. පළාත් පාලන ආයතන වල සංවිධාන ව්‍යුහයට අදාළ මූලික ලක්ෂණයක් ලියන්න.

.................................................................... (ලකුණු 01)

II. පහත සඳහන් පළාත් පාලන ආයතන වල ප්‍රධාන පරිපාලන නිලධාරී තනතුරු හඳුන්වන්නේ කෙසේ ද?

* මහ නගර සභාව - ....................................................
* නගර සභාව - .................................................... (ලකුණු 02)


III. පළාත් පාලන ආයතන වල සේවා සම්බන්ධයෙන් මහජනතාව විසින් ඉටු කළ යුතු යුතුකම් මොනවාද?

1. ....................................................................................
2. ....................................................................................
3. ....................................................................................

(ලකුණු 03)

- අංක 36 -45 දක්වා දී ඇති ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

36. පාහියංගල
37. මහනුවර (සෙංකඩගල)
38. මල්වතු ඔය
39. ගෝකණ්ණ
40. පරාක්‍රම සමුද්‍රය
41. අනුරාධපුරය
42. කෝට්ටෙ
43. මහාතිත්ථ
44. කලා වැව
45. ගල් ඔය



# LOL.lk
## BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**